# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## අපරාධ නඩු විධාන සංග්‍රහය
## (සංශෝධන)

**1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින් 2024 ජූලි මස 10 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2024 ජුනි මස 28 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[272 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 30.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් (මෙහි මින් මතු “ප්‍රධාන ප්‍රඥප්තිය” යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 183 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 3 වන වගන්තිය මගින් සිදු කරනු ලබන සංශෝධනයට ආනුෂංගික වේ.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 183අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් එම ප්‍රඥප්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ චෝදකට සහ මහෙස්ත්‍රාත් අධිකරණයේ චෝදනා නගා ඇති යම් විත්තිකරුවකුට, දණ්ඩනය නියම කිරීමට පෙර ඕනෑම අවස්ථාවක වරද පිළිගැනීමේ එකඟතාවයකට එළඹීමට හැකි වන පරිදි විධිවිධාන සැලැස්වීම වේ.

***4 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 195අ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 6 වන වගන්තිය මගින් සිදු කරනු ලබන සංශෝධනයට ආනුෂංගික වේ.

***5 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් 197 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 6 වන වගන්තිය මගින් සිදු කරනු ලබන සංශෝධනයට ආනුෂංගික වේ.

***6 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 197අ සහ අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් එම ප්‍රඥප්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ චෝදකට සහ මහාධිකරණයේ චෝදනා නගා ඇති විත්තිකරුවකුට, දණ්ඩනය නියම කිරීමට පෙර ඕනෑම අවස්ථාවක වරද පිළිගැනීමේ එකඟතාවයකට එළඹීමට හැකි වන පරිදි විධිවිධාන සැලැස්වීම වේ.

***7 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ වරද පිළිගැනීමේ එකඟතාවයකට එළඹීමේ කාර්යය සඳහා අධිකරණයට ඉදිරිපත් කරනු ලබන වරද පිළිගැනීමේ එකඟතාවයට අදාළ ආකෘතිය නිශ්චිතව දැක්වීම සඳහා අංක 23 දරන නව ආකෘතිය එම උපලේඛනයට ඇතුළත් කිරීම වේ.

# අපරාධ නඩු විධාන සංග්‍රහය
# (සංශෝධන)

එල්.ඩී.-ඕ. 24/2023

## 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

1. මේ පනත 2024 අංක    දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1979 අංක 15 දරන පනතේ 183 වන වගන්තිය සංශෝධනය කිරීම

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 183 වන වගන්තිය එහි පැති සටහන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"වරද පිළිගැනීමේ ලිඛිත එකඟතාවයක් නොමැතිව වරද පිළිගැනීමේ උත්තරවාදය සහ දණ්ඩනය නියම කිරීම".

ප්‍රධාන ප්‍රඥප්තියේ 183අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 183 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 183අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

"වරද පිළිගැනීමේ ලිඛිත එකඟතාවයක් මගින් වරද පිළිගැනීමේ උත්තරවාදය සහ දණ්ඩනය නියම කිරීම

183අ. (1) චෝදක සහ මහෙස්ත්‍රාත් අධිකරණයේ චෝදනා නඟා ඇති චූදිතයකු අතර, මේ වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ක්‍රියාපටිපාටියට යටත්ව, දණ්ඩනය නියම කිරීමට පෙර ඕනෑම අවස්ථාවක වරද පිළිගැනීමේ එකඟතාවයකට එළඹීම සිදු කරනු ලැබිය හැකි ය.

(2) නඩුවක පාර්ශ්වකරුවන් විසින් මේ වගන්තිය යටතේ වරද පිළිගැනීමේ එකඟතාවයකට එළඹීම සඳහා සාකච්ඡා කිරීමට අදහස් කරන අවස්ථාවක අධිකරණයට ඒ පිළිබඳ දැනුම් දිය යුතු ය:

එසේ වුව ද, අධිකරණය එවැනි වරද පිළිගැනීමේ එකඟතාවයක් සඳහා වන සාකච්ඡාවලට සහභාගි නොවිය යුතු ය.

(3) චෝදක, චූදිතයා වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරයා විසින් හෝ චූදිතයා විසින් වරද පිළිගැනීමේ එකඟතාවයකට එළඹීමට යෝජනා කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, චූදිතයා සමඟ වරද පිළිගැනීමේ එකඟතාවයකට එළඹෙන්නේ ද නැද්ද යන්න පිළිබඳව පරම අභිමතය චෝදක සතු විය යුතු ය.

(4) චූදිතයාට චෝදනා නඟනු ලැබ ඇත්තේ (22 වන අධිකාරය වූ) අපරාධ වැළැක්වීමේ ආඥාපනතේ උපලේඛනය යටතේ වන වරදක් සම්බන්ධයෙන් නම් මහෙස්ත්‍රාත්වරයා විසින් චූදිතයාගේ ඇඟිලි සටහන් ලබා ගැනීමට සලස්වා ඒ ඇඟිලි සටහන් පිළිබඳ වාර්තාවක් කැඳවනු ලැබිය යුතු ය.

(5) වරද පිළිගැනීමේ එකඟතාවයකට එළඹීම සඳහා වන සාකච්ඡා චෝදක සහ චූදිතයා වෙනුවෙන් පෙනී සිටින නීතීඥවරයා අතර පවත්වනු ලැබිය යුතු ය:

එසේ වුව ද, වරද පිළිගැනීමේ එකඟතාවයකට එළඹීමට අදහස් කරන චූදිතයකු නීතිඥවරයකු මාර්ගයෙන් පෙනී නොසිටින අවස්ථාවක තමා වෙනුවෙන් සාකච්ඡා කර එකඟතාවයකට එළඹීම සඳහා නීතිඥවරයකුගේ සේවය අවශ්‍යදැයි අධිකරණය විසින් අසනු ලැබීමේ දී එසේ සේවය ලබා දෙන මෙන් චූදිතයා විසින් ඉල්ලා සිටිනු ලබන අවස්ථාවක, නීතිඥවරයකුගේ සේවය එසේ ලබාදිය යුතු ය.

(6) වරද පිළිගැනීමේ එකඟතාවයකට එළඹීමේ සාකච්ඡා අතරතුර දී සහයෝගයක් ලෙස චූදිතයා විසින් සපයනු ලැබිය හැකි, චූදිතයා විසින් එළඹුණු

අපරාධකාරී හැසිරීම පිළිබඳ සම්පූර්ණ විස්තරය සහ අනෙකුත් අය විසින් එළඹුණු අපරාධකාරී හැසිරීම පිළිබඳ තොරතුරු පැමිණිල්ල සෑහීමට පත් වන පරිදි නිසැකව දැන ගැනීම පිණිස චෝදක විසින් එම සාකච්ඡා ක්‍රියාවලියේ කොටසක් ලෙස චූදිතයා වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරයා හමු වීම සිදු කරනු ලැබිය හැකි ය.

(7) වරද පිළිගැනීමේ එකඟතාවයකට එළඹීමේ සාකච්ඡා අතරතුර දී -

(අ) නඩුවේ ස්වභාවය සහ එයට අදාළ වන අවස්ථානුගත කරුණු, වරද කිරීම නිසා වින්දිතයාට ඇති වූ බලපෑම, චූදිතයාගේ පෞද්ගලික අවස්ථානුගත කරුණු, මහජන යහපත සහ සාකච්ඡාවල කොටසක් ලෙස චූදිතයා විසින් දක්වන ලද සහයෝගය ද ඇතුළුව ඔහු විසින් සපයන ලද තොරතුරුවල වැදගත්කම පිළිබඳ චෝදක විසින් සලකා බැලිය යුතු ය;

(ආ) විත්තිකරුගෙන් ලබාගත් තොරතුරු, එම වරද පිළිගැනීමේ එකඟතාවයකට එළඹීමේ සාකච්ඡා අවසානයේ දී අසාර්ථක වී නඩු පවරනු ලබන අවස්ථාවක චෝදක විසින් විත්තිකරුට එරෙහිව භාවිත නොකළ යුතු ය; සහ

(ඇ) අවස්ථානුගත කරුණු මත එවැනි නියෝජනයක් වළක්වා ඇත්නම් මිස, අපරාධයේ බලපෑම සම්බන්ධයෙන් ලිඛිත නියෝජනයක් පැමිණිල්ල වෙත ඉදිරිපත් කිරීම සඳහා සාධාරණ අවස්ථාවක් චෝදක විසින් -

(i) වින්දිතයාට;

(ii) වින්දිතයාගේ නීතිඥවරයාට; හෝ

(iii) 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ පිහිටුවන ලද අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරියට,

සලසා දිය යුතු ය.

(8) (අ) චෝදක සහ චූදිතයා හෝ චූදිතයා වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරයා විසින්, පැනවිය යුතු දණ්ඩනයට අදාළව, ඒ එක් එක් තැනැත්තාගේ විශේෂිත නිර්දේශයක් අධිකරණයට ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, අවසාන වරද පිළිගැනීමේ එකඟතාවයේ එම නිර්දේශය ලිඛිතව ඇතුළත් කරනු ලැබිය යුතු ය.

(ආ) පාර්ශ්වයන්ගේ නිර්දේශවල කුමක් සඳහන් වුව ද, දණ්ඩනය නියම කිරීමේ පරම අභිමතය අධිකරණය සතු විය යුතු ය.

(ඇ) වරද පිළිගැනීමේ එකඟතාවයේ ඇතුළත් කළ නිර්දේශයේ දණ්ඩනයට වඩා දැඩි දණ්ඩනයක් පැනවීමට චෝදක විසින් අධිකරණයට නිර්දේශ කරනු ලබන අවස්ථාවක චූදිතයා විසින් වරද පිළිගැනීමේ උත්තරවාදය ඉල්ලා අස්කරගෙන වරද පිළිගැනීමේ එකඟතාවය ඉවත් කරගනු ලැබිය හැකි ය.

(ඇ) වරද පිළිගැනීමේ එකඟතාවයේ නිර්දේශයේ ඇතුළත් දණ්ඩනයට වඩා අඩු දණ්ඩනයක් පැනවීමට චූදිතයා විසින් අධිකරණයට නිර්දේශ කරන අවස්ථාවක චූදිතයාට ඒ හේතුව මත පදනම්ව පමණක් ඔහුගේ වරද පිළිගැනීමේ උත්තරවාදය ඉල්ලා අස්කර ගැනීමට අවසර ලබා නොදිය යුතු ය.

(ඉ) වරද පිළිගැනීමේ එකඟතාවයේ නිර්දේශයේ ඇතුළත් දණ්ඩනයට වඩා අඩු දණ්ඩනයක් චූදිතයා විසින් අධිකරණයට නිර්දේශ කරනු ලබන අවස්ථාවක, චෝදක විසින් වෙනත් යම් සුදුසු දණ්ඩනයක් අධිකරණයට නිර්දේශ කරනු ලැබිය හැකි ය.

(9) (අ) චූදිතයා වරද පිළිගැනීමේ එකඟතාවයේ කොන්දේසි මත වරද පිළිගනු ලබන අවස්ථාවක, චෝදක විසින් තමා සහ චූදිතයා අතර ඇති කර ගනු ලැබූ වරද පිළිගැනීමේ එකඟතාවයේ දක්වා ඇති වරද පිළිගැනීමේ උත්තරවාදයට පාදක වූ සිද්ධිමය කරුණුවල පදනම එම එකඟතාවයේ අවසන් පිටපත සමඟ නඩු විභාගයේ දී අධිකරණයට ඉදිරිපත් කළ යුතු ය. එම සිද්ධිමය කරුණුවල පදනම සම්පූර්ණ කරන ලද වරද පිළිගැනීමේ එකඟතාවයේ කොටසක් ලෙස එහි ලිඛිතව ඇතුළත් විය යුතු ය.

(ආ) අධිකරණයට ඉදිරිපත් කරනු ලබන වරද පිළිගැනීමේ එකඟතාවය දෙවන උපලේඛනයේ 23 වන ආකෘතියේ නිශ්චිතව සඳහන් කර ඇති ආකාරයට විය යුතු ය.

(ඇ) චූදිතයා ළමයකු වන අවස්ථාවක, වරද පිළිගැනීමේ එකඟතාවයට ළමයාගේ මව හෝ පිය හෝ භාරකරු විසින් අත්සන් කරනු ලැබිය යුතු ය.

(ඈ) චූදිතයා වරද පිළිගැනීමේ එකඟතාවය අත්සන් කළ පසු එම එකඟතාවය අවසානාත්මක විය යුතු ය.

(10) චූදිතයා දැනුම්වත්ව සහ ස්වේච්ඡාවෙන් වරද පිළිගැනීමේ එකඟතාවය අත්සන් කර ඇති බවට සෑහීමට පත් වීමෙන් පසුව අධිකරණය විසින් වරද පිළිගැනීමේ එකඟතාවය පිළිගනු ලැබිය හැකි ය.

(11) වරද පිළිගැනීමේ එකඟතාවය අධිකරණය විසින් පිළිගනු ලබන අවස්ථාවක, එම එකඟතාවයෙන් පාර්ශ්වයන් බැඳී සිටින අතර, අධිකරණය විසින් ඒ අනුව චූදිතයා වරදකරු කිරීමට කටයුතු කළ යුතු ය.

(12) අධිකරණය විසින් වරද පිළිගැනීමේ එකඟතාවය පිළිගෙන (11) වන උපවගන්තිය යටතේ චූදිතයා වරදකරු කිරීමෙන් පසුව, එම වරදකරු කිරීමට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කළ නොහැකි විය යුතු ය.

(13) අධිකරණය විසින් නියම කරන ලද දණ්ඩනය, වරද පිළිගැනීමේ එකඟතාවයේ පාර්ශ්වයන් විසින් නිර්දේශ කරන ලද දණ්ඩන පරාසය තුළ වන අවස්ථාවක, එම දණ්ඩනයට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කළ නොහැකි විය යුතු ය.

(14) වරද පිළිගැනීමේ එකඟතාවය අධිකරණය විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී -

(අ) ඒ ප්‍රතික්ෂේප කිරීම සඳහා වන හේතු වාර්තාගත කළ යුතු අතර, ඒ පිළිබඳව ඒ පාර්ශ්වයන්ට දැනුම් දෙනු ලැබිය යුතු ය; සහ

(ආ) වරද පිළිගැනීමේ එකඟතාවය ශූන්‍ය සහ බලරහිත බවට පත්විය යුතු අතර පාර්ශ්වකරුවන් ඒ එකඟතාවයෙන් තවදුරටත් බැඳී නොසිටිය යුතු ය.

(15) වරද පිළිගැනීමේ එකඟතාවය ප්‍රතික්ෂේප වීමෙන් හෝ ඉල්ලා අස්කර ගැනීමෙන් පසුව, එම චෝදනාවටම සහ එම සිද්ධිමය කරුණුවලටම අදාළ නඩු විභාගයකදී, අධිකරණයේ පූර්ව අවසරය මත නව වරද පිළිගැනීමේ එකඟතාවයක් පිළිබඳව සාකච්ඡා කිරීම සලකා බලනු ලැබිය හැකි ය.

(16) අධිකරණය විසින් මේ වගන්තිය යටතේ වරද පිළිගැනීමේ එකඟතාවයක් ප්‍රතික්ෂේප කර ඇති අවස්ථාවක, එම එකඟතාවය ප්‍රතික්ෂේප කිරීමේ ආඥාවට එරෙහිව කිසිදු පාර්ශ්වයක් විසින් අභියාචනය කිරීම හෝ ප්‍රතිශෝධනය කිරීම සඳහා ඉල්ලුම් කිරීම නොකළ යුතු ය.

(17) මේ වගන්තියේ කාර්ය සඳහා -

"ළමයා" යන්නෙන්, වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තකු අදහස් වේ;

"චෝදක" යන්නට, මේ සංග්‍රහයේ 191 වන වගන්තිය යටතේ එම යෙදුමට දී ඇති අර්ථයම තිබිය යුතු අතර එයට 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත යටතේ පිහිටුවන ලද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ මහෙස්ත්‍රාත් අධිකරණයේ දී චෝදනා පත්‍රයක් මත පවත්වනු ලබන වරදක් විභාග කිරීමේ නඩුවක දී පැමිණිල්ල මෙහෙයවීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් බලය දෙනු ලැබූ එම කොමිෂන් සභාවේ නිලධරයකු හෝ ඒ සඳහා කොමිෂන් සභාව විසින් විශේෂයෙන් බලය දෙනු ලැබූ නීතිඥවරයකු ද ඇතුළත් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 195අ වන වගන්තිය සංශෝධනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 195අ වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදයේ, "උත්තරවාද දීමට අදහස් කරන්නේ ද" යන වචන වෙනුවට, "උත්තරවාද දීමට අදහස් කරන්නේ ද හෝ 197අ වන වගන්තිය යටතේ වරද පිළිගැනීමේ එකඟතාවයකට එළඹීමට සාකච්ඡා කිරීමට ඔහු අදහස් කරන්නේ ද" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 197 වන වගන්තිය සංශෝධනය කිරීම*

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 197 වන වගන්තිය එහි පැති සටහන ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"වරද පිළිගැනීමේ ලිඛිත එකඟතාවයක් නොමැතිව වරද පිළිගැනීමේ උත්තරවාදය සහ දණ්ඩනය නියම කිරීම".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 197අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම*

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 197 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ඒ ප්‍රඥප්තියේ 197අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

"වරද පිළිගැනීමේ ලිඛිත එකඟතාවයක් මගින් වරද පිළිගැනීමේ උත්තරවාදය සහ දණ්ඩනය නියම කිරීම

197අ. (1) චෝදක සහ මහාධිකරණයේ චෝදනා නගා ඇති චූදිතයකු අතර දණ්ඩනය නියම කිරීමට පෙරාතුව ඕනෑම අවස්ථාවක මේ වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ක්‍රියාපටිපාටියට යටත්ව, වරද පිළිගැනීමේ එකඟතාවයකට එළඹීම සිදු කරනු ලැබිය හැකි ය.

(2) නඩුවක පාර්ශ්වකරුවන් විසින් මේ වගන්තිය යටතේ වරද පිළිගැනීමේ එකඟතාවයකට එළඹීම සඳහා සාකච්ඡා කිරීමට අදහස් කරන අවස්ථාවක ඒ පිළිබඳව අධිකරණයට දැනුම් දිය යුතු යඃ

එසේ වුව ද, අධිකරණය එවැනි වරද පිළිගැනීමේ එකඟාතාවයක් සඳහා වන සාකච්ඡාවලට සහභාගි නොවිය යුතු ය.

(3) චෝදක විසින් චූදිතයා වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරයා විසින් හෝ චූදිතයා විසින් වරද පිළිගැනීමේ එකඟතාවයකට එළඹීමට යෝජනා කරනු ලැබිය හැකි යඃ

එසේ වුව ද, චූදිතයා සමග වරද පිළිගැනීමේ එකඟතාවයකට එළඹෙන්නේ ද නැද්ද යන්න පිළිබඳ පරම අභිමතය චෝදක සතු විය යුතු ය.

(4) චූදිතයාට මහාධිකරණයේ අධිචෝදනා ගොනු කරනු ලැබූයේ නම්, එම අධිකරණය විසින් චූදිතයාගේ ඇඟිලි සලකුණු සටහන් කරගැනීමට සලස්වා 195 වන වගන්තියේ (ඉ) ඡේදයේ විධිවිධානවලට අනුකූලව ඇඟිලි සලකුණු වාර්තාවක් කැඳවිය යුතු ය.

(5) වරද පිළිගැනීමේ එකඟතාවයකට එළඹීම සඳහා වන සාකච්ඡා චෝදක සහ චූදිතයා වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරයා අතර පවත්වනු ලැබිය යුතු ය:

එසේ වුව ද, වරද පිළිගැනීමේ එකඟතාවයකට එළඹීමට අදහස් කරන චූදිතයකු නීතිඥවරයකු මාර්ගයෙන් පෙනී නොසිටින අවස්ථාවක තමා වෙනුවෙන් සාකච්ඡා කර එකඟතාවයකට එළඹීම සඳහා නීතිඥවරයකුගේ සේවය අවශ්‍යදැයි අධිකරණය විසින් අසනු ලැබීමේ දී එසේ සේවය ලබා දෙන මෙන් චූදිතයා විසින් ඉල්ලා සිටිනු ලබන අවස්ථාවක, නීතිඥවරයකුගේ සේවය එසේ ලබාදිය යුතු ය.

(6) වරද පිළිගැනීමේ එකඟතාවයකට එළඹීමේ සාකච්ඡා අතරතුර දී සහයෝගයක් ලෙස චූදිතයා විසින් ඉදිරිපත් කරනු ලැබිය හැකි, චූදිතයා විසින් එළඹුණු අපරාධකාරී හැසිරීම පිළිබඳ සම්පූර්ණ විස්තරය සහ අනෙක් අය විසින් එළඹුණු අපරාධකාරී හැසිරීම පිළිබඳ තොරතුරු පැමිණිල්ල සෑහීමට පත් වන පරිදි නිසැකව දැන ගැනීම පිණිස චෝදක විසින් එම සාකච්ඡා ක්‍රියාවලියේ කොටසක් ලෙස චූදිතයා වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරයා හමු වීම සිදු කරනු ලැබිය හැකි ය.

(7) වරද පිළිගැනීමේ එකඟතාවයකට එළඹීමේ සාකච්ඡා අතරතුර දී -

(අ) නඩුවේ ස්වභාවය සහ එයට අදාළ වන අවස්ථානුගත කරුණු, වරද කිරීම නිසා වින්දිතයාට ඇති වූ බලපෑම, චූදිතයාගේ පෞද්ගලික අවස්ථානුගත කරුණු, මහජන යහපත සහ සාකච්ඡාවල කොටසක් ලෙස චූදිතයා විසින් දක්වන ලද සහයෝගයද ඇතුළුව ඔහු විසින් සපයන ලද තොරතුරුවල වැදගත්කම පිළිබඳ චෝදක විසින් සලකා බැලිය යුතු ය;

(ආ) විත්තිකරුගෙන් ලබාගත් තොරතුරු, චෝදක එම වරද පිළිගැනීමේ එකඟතාවයකට එළඹීමේ සාකච්ඡා අවසානයේ දී අසාර්ථක වී නඩු පවරනු ලබන අවස්ථාවක චෝදක විසින් විත්තිකරුට එරෙහිව භාවිත නොකළ යුතු ය; සහ

(ඇ) අවස්ථානුගත කරුණු මත එවැනි නියෝජනයක් වළක්වා ඇත්නම් මිස, අපරාධයේ බලපෑම සම්බන්ධයෙන් ලිඛිත නියෝජනයක් පැමිණිල්ල වෙත ඉදිරිපත් කිරීම සඳහා සාධාරණ අවස්ථාවක් චෝදක විසින් -

(i) වින්දිතයාට;

(ii) වින්දිතයාගේ නීතිඥවරයාට; හෝ

(iii) 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ පිහිටුවන ලද අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරියට,

සලසා දිය යුතු ය.

(8) (අ) චෝදක සහ චූදිතයා හෝ චූදිතයා වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරයා විසින්, පැනවිය යුතු දණ්ඩනයට අදාළව, ඒ එක් එක් තැනැත්තාගේ විශේෂිත නිර්දේශයක් අධිකරණයට ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, අවසාන වරද පිළිගැනීමේ එකඟතාවයේ එම නිර්දේශය ලිඛිතව ඇතුළත් කරනු ලැබිය යුතු ය.

(ආ) පාර්ශ්වයන්ගේ නිර්දේශවල කුමක් සඳහන් වුව ද, දණ්ඩනය නියම කිරීමේ පරම අභිමතය අධිකරණය සතු විය යුතු ය.

(ඇ) වරද පිළිගැනීමේ එකඟතාවයේ ඇතුළත් කළ නිර්දේශයේ දණ්ඩනයට වඩා දැඩි දණ්ඩනයක් පැනවීමට චෝදක විසින් අධිකරණයට නිර්දේශ කරනු ලබන අවස්ථාවක චූදිතයා විසින් වරද පිළිගැනීමේ උත්තරවාදය ඉල්ලා අස්කරගෙන වරද පිළිගැනීමේ එකඟතාවය ඉවත් කරගනු ලැබිය හැකි ය.

(ඈ) චූදිතයා විසින් (ඇ) ඡේදය යටතේ තම වරද පිළිගැනීමේ උත්තරවාදය ඉල්ලා අස්කරගනු ලැබූ අවස්ථාවක වරදකරු කිරීම සටහන් කරනු නොලැබුවාක් මෙන් නඩු විභාගය පැවැත්වීමට විනිශ්චයකාරවරයා විසින් කටයුතු කළ යුතු ය.

(ඉ) වරද පිළිගැනීමේ එකඟතාවයේ නිර්දේශයේ ඇතුළත් දණ්ඩනයට වඩා අඩු දණ්ඩනයක් පැනවීමට චූදිතයා විසින් අධිකරණයට නිර්දේශ කරනු ලබන අවස්ථාවක චූදිතයාට ඒ හේතුව මත පදනම්ව පමණක් ඔහුගේ වරද පිළිගැනීමේ උත්තරවාදය ඉල්ලා අස්කර ගැනීමට අවසර ලබා නොදිය යුතු ය.

(ඊ) වරද පිළිගැනීමේ එකඟතාවයේ නිර්දේශයේ ඇතුළත් දණ්ඩනයට වඩා අඩු දණ්ඩනයක් චූදිතයා විසින් අධිකරණයට නිර්දේශ කරනු ලබන අවස්ථාවක, චෝදක විසින් වෙනත් යම් සුදුසු දණ්ඩනයක් අධිකරණයට නිර්දේශ කරනු ලැබිය හැකි ය.

(9) (අ) චූදිතයා වරද පිළිගැනීමේ එකඟතාවයේ කොන්දේසි මත වරද පිළිගනු ලබන අවස්ථාවක, චෝදක විසින් තමා සහ චූදිතයා අතර ඇති කර ගනු ලැබූ වරද පිළිගැනීමේ එකඟතාවයේ දක්වා ඇති වරද පිළිගැනීමේ උත්තරවාදයට පාදක වූ සිද්ධිමය කරුණුවල පදනම එම වරද පිළිගැනීමේ එකඟතාවයේ අවසන් පිටපත සමඟ නඩු විභාගයේ දී අධිකරණයට ඉදිරිපත් කළ යුතු ය. එම සිද්ධිමය කරුණුවල පදනම සම්පූර්ණ කරන ලද එකඟතාවයේ කොටසක් ලෙස එහි ලිඛිතව ඇතුළත් විය යුතු ය.

(ආ) අධිකරණයට ඉදිරිපත් කරනු ලබන වරද පිළිගැනීමේ එකඟතාවය දෙවන උපලේඛනයේ 23 වන ආකෘතියේ නිශ්චිතව සඳහන් කර ඇති ආකාරයට විය යුතු ය.

(ඇ) චූදිතයා ළමයකු වන අවස්ථාවක, වරද පිළිගැනීමේ එකඟතාවයට ළමයාගේ මව හෝ පියා භාරකරු විසින් අත්සන් කරනු ලැබිය යුතු ය.

(ඈ) චූදිතයා වරද පිළිගැනීමේ එකඟතාවය අත්සන් කළ පසු එම එකඟතාවය අවසානාත්මක විය යුතු ය.

(10) චූදිතයා දැනුම්වත්ව සහ ස්වේච්ඡාවෙන් වරද පිළිගැනීමේ එකඟතාවය අත්සන් කර ඇති බවට සෑහීමට පත් වීමෙන් පසුව අධිකරණය විසින් වරද පිළිගැනීමේ එකඟතාවය පිළිගනු ලැබිය හැකි ය.

(11) වරද පිළිගැනීමේ එකඟතාවය අධිකරණය විසින් පිළිගනු ලබන අවස්ථාවක, එම එකඟතාවයෙන් පාර්ශ්වයන් බැඳී සිටින අතර, අධිකරණය විසින් ඒ අනුව චූදිතයා වරදකරු කිරීමට කටයුතු කළ යුතු ය.

(12) අධිකරණය විසින් වරද පිළිගැනීමේ එකඟතාවය පිළිගෙන (11) වන උපවගන්තිය යටතේ චූදිතයා වරදකරු කිරීමෙන් පසුව, එම වරදකරු කිරීමට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කළ නොහැකි විය යුතු ය.

(13) අධිකරණය විසින් නියම කරන ලද දණ්ඩනය, වරද පිළිගැනීමේ එකඟතාවයේ පාර්ශ්වයන් විසින් නිර්දේශ කරන ලද දණ්ඩන පරාසය තුළ වන අවස්ථාවක, එම දණ්ඩනයට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කළ නොහැකි විය යුතු ය.

(14) වරද පිළිගැනීමේ එකඟතාවය අධිකරණය විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී -

(අ) ඒ ප්‍රතික්ෂේප කිරීම සඳහා වන හේතු වාර්තාගත කළ යුතු අතර, ඒ පිළිබඳව ඒ පාර්ශ්වයන්ට දැනුම් දෙනු ලැබිය යුතු ය; සහ

(ආ) වරද පිළිගැනීමේ එකඟතාවය ශූන්‍ය සහ බලරහිත බවට පත්විය යුතු අතර පාර්ශ්වකරුවන් ඒ එකඟතාවයෙන් තවදුරටත් බැඳී නොසිටිය යුතු ය.

(15) වරද පිළිගැනීමේ එකඟතාවය ප්‍රතික්ෂේප වීමෙන් හෝ ඉල්ලා අස්කරගැනීමෙන් පසුව, එම චෝදනාවටම සහ එම සිද්ධිමය කරුණුවලටම අදාළ නඩු විභාගයකදී, අධිකරණයේ පූර්ව අවසරය මත නව වරද පිළිගැනීමේ එකඟතාවයක් පිළිබඳව සාකච්ඡා කිරීම සලකා බලනු ලැබිය හැකි ය.

(16) අධිකරණය විසින් මේ වගන්තිය යටතේ වරද පිළිගැනීමේ එකඟතාවයක් ප්‍රතික්ෂේප කර ඇති අවස්ථාවක, එම එකඟතාවය ප්‍රතික්ෂේප කිරීමේ ආඥාවට එරෙහිව කිසිදු පාර්ශ්වයක් විසින් අභියාචනය කිරීම හෝ ප්‍රතිශෝධනය කිරීම සඳහා ඉල්ලුම් කිරීම නොකළ යුතු ය.

(17) මේ වගන්තියේ කාර්යන් සඳහා -

"ළමයා" යන්නෙන්, වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තකු අදහස් වේ;

"චෝදක" යන්නට, මේ සංග්‍රහයේ 193 වන වගන්තිය යටතේ එම යෙදුමට දී ඇති අර්ථයම තිබිය යුතු අතර එයට 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත යටතේ පිහිටුවන ලද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ එම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අත්සන් කරන ලද අධිචෝදනා පත්‍රයක් මත මහාධිකරණයේ දී පවත්වනු ලබන වරදක් විභාග කිරීමේ නඩුවක දී පැමිණිල්ල මෙහෙයවීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් බලය දෙනු ලැබූ එම කොමිෂන් සභාවේ නිලධරයකු හෝ ඒ සඳහා කොමිෂන් සභාව විසින් විශේෂයෙන් බලය දෙන ලැබූ නීතිඥවරයකු ද ඇතුළත් වේ.".

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ 22 වන ආකෘතියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ආකෘතිය ඇතුළත් කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලබන අතර, එය ඒ උපලේඛනයේ 23 වන ආකෘතිය ලෙස බලාත්මක විය යුතු ය. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම

"අංක 23

(183අ සහ 197අ වගන්ති)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
...................................... අධිකරණයේ දී ය.
නඩු අංකය: ......................................
චූදිතයාගේ නම: ......................................

**වරද පිළිගැනීමේ එකඟතාවය**

1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 183අ/197අ වගන්තියට අනුකූලව චූදිත වන ...................................... වන මම පහත දැක්වෙන කරුණුවලට එකඟ වෙමි:-

| | |
|---|---|
| 1. | චූදිතයා ස්වාධීනවද, ස්වේච්ඡාවෙන්ද, කිසිදු තර්ජනයක්, බලපෑමක්, බිය වැද්දීමක් හෝ යම් ආකාරයක බලකිරීමකින් ද තොරව සහ මේ එකඟතාවයන් අන්තර්ගතව ඇති පරිදි හැර කිසිදු ආකාරයක ප්‍රතිඥාවක් හෝ අර්ථලාභයකින් තොරව මේ වරද පිළිගැනීමේ එකඟතාවයට ඇතුළත්ව වරදකරු බව කියා සිටී. |
| 2. | චූදිතයා විසින් මෙහි ඇතුළත් කරුණු දැනුම්වත්ව, ස්වේච්ඡාවෙන්ම සහ සත්‍යවාදීව පිළිගනු ලැබේ. |
| 3. | චූදිතයා .............................. යටතේ දඬුවම් කළ හැකි ............................ වරදට වරදකරු බවට කියා සිටී. |
| 4. | චූදිතයා විසින් වරදකරු බව කියා සිටින වරදට අදාළ සියලු කරුණු සහ ඒ වරද සඳහා වන උපරිම දණ්ඩනය ................. ....... බවට අවබෝධ කරගෙන සිටී. |
| 5. | වරද පිළිගැනීමේ එකඟතාවයේ වන සියලු නියමයන් සහ කොන්දේසි අධිකරණය විසින් පිළිගෙන චූදිතයා විසින් සම්පූර්ණ කිරීමෙන් පසුව පවත්නා චෝදනාවට අනුව මෙහෙය වූ විමර්ශන අනුව චූදිතයා වෙත වෙනත් චෝදනා ගොනු නොකරන බවට චෝදක පක්ෂය එකඟ වේ. |
| 6. | නඩු විභාග කිරීමේ අයිතිය, විත්තිකරුවන්ගෙන් ප්‍රශ්න ඇසීම සහ හරස් ප්‍රශ්න ඇසීමේ අයිතිය ඇතුළුව චූදිතයාගේ ව්‍යවස්ථානුකූල අයිතීන් පිළිබඳව ඔහු/ඇය වෙනුවෙන් පෙනී සිටින නීති නියෝජිතයා සහ අධිකරණය විසින් චූදිතයා දැනුවත් කිරීමෙන් පසුව, අභියාචනය කිරීමේ අයිතිය ද ඇතුළුව මෙම අයිතිවාසිකම් චූදිතයා විසින් දැණුම්වත්ව සහ ස්වේච්ඡාවෙන්ම අත්හැර මේ වරද පිළිගැනීමේ එකඟතාවයේ දක්වා ඇති පරිදි වරද පිළිගැනීමට එකඟ වේ. |

7. චූදිතයා වරද පිළිගන්නා බවට වන ඔහුගේ හෝ ඇයගේ උත්තරවාදය මත වරදකරු කිරීමෙන් පසු පනවනු ලබන දණ්ඩනය අධිකරණයේ පරම අභිමතය මත සිදු කරනු ලබන බවට චූදිතයා අවබෝධ කරගෙන මේ සඳහා එකඟ වේ. දණ්ඩනය නියම කිරීමේ දී චෝදක විසින් ..................................... නිර්දේශ කරනු ලැබේ. දණ්ඩනය නියම කිරීමේ දී චූදිතයා විසින් ................................ නිර්දේශ කරනු ලැබේ.

8. මෙම වරද පිළිගැනීමේ එකඟතාවයට අදාළ චෝදනා සම්බන්ධයෙන් මෙම එකඟතාවයේ ප්‍රකාශිතව ඇතුළත් කර ඇති කරුණු හැර වෙනත් කිසිදු ප්‍රතිඥාවක්, එකඟතාවයක් හෝ කොන්දේසියක් නොමැති බව ද මෙම එකඟතාවයේ ලිඛිතව සඳහන් කර ඇති කරුණුවලින් මිස වෙනත් කිසිවකට චෝදක සහ චූදිත බැඳී නොසිටින බව ද චූදිතයා මෙයින් අවබෝධ කර ගනිමින් එකඟ වේ.

මා හට තේරුම්ගත හැකි භාෂාවකින් මා වෙත පැහැදිලි කර දෙනු ලැබ ඇති මේ වරද පිළිගැනීමේ එකඟතාවයෙන් ආවරණය කළ වැරදිවලට මම වරද පිළිගනු ලබන අතර, වරද පිළිගැනීමේ එකඟතාවයේ දක්වා ඇති සෑම කරුණකටම මම එකඟ වෙමි. මම, කිසිදු තර්ජනයක්, බලපෑමක්, බිය වැද්දීමක් හෝ යම් ආකාරයේ බල කිරීමකින් තොරව සහ දැනුම්වත්ව, ස්වාධීනව සහ ස්වේච්ඡාවෙන් මේ සඳහා එකඟ වෙමි.

චූදිත: ................................
දිනය: ................................ ”.

8. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව